# පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
# நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம்
# DEPARTMENT OF PROBATION AND CHILD CARE SERVICES

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
பெண்கள் மற்றும் சிறுவர் விவகாரங்கள் அமைச்சு
Ministry of Women and Child Affairs


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது.இல<br>My Number | PCC/03/05/WCD/06/2025 | ඔබේ අංකය<br>உமது.இல<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2025.09.18 |

**දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :PCC/01/2025**

ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ලේකම් - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ලේකම් - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ලේකම් - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ලේකම් - ප්‍රවාහන, මහා මාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

<u>ලෝක ළමා දින ජාතික සති වැඩසටහන - 2025 - "ආදරෙන් සුරකින්න - අපට ලොව දිනන්නට "</u>

ලෝක ළමා දිනය නිමිත්තෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මඟපෙන්වීමෙන් ලෝක ළමා දින ජාතික සතියක් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව ළමුන් සම්බන්ධව කටයුතු කරන අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතනවල සහයෝගය ඇතිව දරුවන්ගේ උපරිම යහපත සාධනය කිරීමේ අරමුණ ඇතිව 2025.09.25 සිට 2025.10. 01 දින දක්වා වූ සතිය තුළ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබේ.

වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු:-

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (UNCRC) පිළිගත් රටක් ලෙස, ශ්‍රී ලංකාව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට බැඳී සිටියි. ලෝක ළමා දින ජාතික සතියක් නම් කර වැඩසටහන් මාලාවක් සතියක් පුරා ක්‍රියාවට නැංවීම මඟින් ළමා අයිතිවාසිකම් පිළිබඳ පුළුල් දැනුම්වත්වීමක් සමාජය තුළ ඇති කිරීම.


බී කොටස, 03 වන මහල , සෙත්සිරිපාය IIවන අදියර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பீ"பிரிவு,03ம் மாடி,ஐஐம் தொகுதி,செத்சிரிபாய,பத்தரமுல்லை, இலங்கை.
**WingB, 03rd Floor, Sethsiripaya Stage II,Battaramulla, Sri Lanka**

විද්‍යුත් තැපැල/**மின்னஞ்சல் /E-mail: pcc@sltnet.lk**
වෙබ්/**இணையம்/ Web : www.probation.gov.lk**
කාර්යාලය/காரியாலயம் /**Office** :0112186062
ෆැක්ස්/ **தொலைநகல்/Fax** : 011 **2187285/ 011 2186065**

- ළමා දින සැමරුම එක දිනකට පමණක් සීමා නොකර ළමුන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන එක්ව ළමා දින ජාතික සතිය තුළ විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහන් ගණනාවක් සිදු කිරීම මගින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අදාළ ක්‍රියාකාරකම් ඒකාබද්ධ ප්‍රවේශයකින් සිදු කිරීම.

- ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත අර්ථවත් වැඩසටහන් ගණනාවක් සිදු කිරීම මගින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත වූ රටක් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම.

**2025 ලෝක ළමා දින තේමාව :-** "ආදරෙන් සුරකින්න - අපට ලොව දිනන්නට "

**ලෝක ළමා දින ලෝගෝව:-**

WORLD CHILDREN'S DAY 2025

ආදරෙන් සුරකින්න - අපට ලොව දිනන්නට
உலகை வழிநடாத்த - அன்பால் போஷியுங்கள்
NURTURE WITH LOVE - TO LEAD THE WORLD

**_1. පළමු වන දිනය -2025-09-25_**

වැඩසටහන- ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විදුහල්පතිවරුන්ගේ භූමිකාව සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම

**ක්‍රියාත්මක කරන ආයතනය** - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මාර්ගෝපදේශය යටතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ කලාප අධ්‍යාපන කාර්යාල මගින්

වැඩසටහන් සංඛ්‍යාව -100

අරමුණු:-

- ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පාසල් පද්ධතිය තුළ විදුහල්පතිවරයකුගේ කාර්යභාරය හඳුන්වා දීම
- දරුවන් සම්බන්ධයෙන් පවතින නීති පිළිබඳ දැනුම්වත්භාවය ලබාදීම මගින් පාසලට යොමුවන දරුවන් මෙන්ම බාහිර සමාජයේ දරුවන්ට සිදු වන හිංසන අවම කිරීමට විදුහල්පතිවරුන් ප්‍රමුඛ පාසල් ගුරුවරුන්ගේ සහාය ලබා ගැනීම
- දරුවන්ට අවශ්‍ය අනෙකුත් සහායක සේවාවන් සම්පාදනය සඳහා විදුහල්පතිවරුන්ගේ දායකත්වය ලබා ගැනීම
- ළමා අයිතිවාසිකම් පිළිබඳව විදුහල්පතිවරුන්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම
- අවදානමට ලක්විය හැකි දරුවන් හඳුනාගෙන ඊට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමට සහ ග්‍රාමීය ළමා සංවර්ධන කමිටුව සක්‍රීයව පවත්වාගෙන යාමට විදුහල්පතිවරුන් ප්‍රමුඛ ගුරු භවතුන්ගේ සහය ලබා ගැනීම

ක්‍රමවේදය:-

- අධ්‍යාපන කලාප මට්ටමින් සියලුම විදුහල්පතිවරුන් දැනුම්වත් කිරීම
- මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකසා ගැනීම (කලාපය තුළ පවතින පාසල් සහ සිසුන් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සහ නිලධාරීන්)

කාල සීමාව :- උපරිම කාලය පැය 02 කි

දැනුම්වත් කළ යුතු කරුණු :-

හැඳින්වීම

- ➢ ළමයා යනු කවුද?
- ➢ ළමයින් සම්බන්ධයෙන් අදාළ වන නීති මොනවාද?
- ➢ ළමා අයිතිවාසිකම් මූලධර්ම (දරුවාගේ උපරිම යහපත, වෙනස්කොට නොසැලකීම, පැවැත්ම හා සංවර්ධනය, දරුවාගේ මතය)

➢ දරුවන් සම්බන්ධව සැලකිලිමත් විය යුතු කරුණු පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ පැහැදිලි කිරීම

**<u>i) දරුවන්ගේ සංවර්ධනය</u>**

පාසලේ දී හෝ බාහිර පරිසරයේ දී හෝ හමුවන දරුවන් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට/ගුරුවරුන්ට සිදු කළ හැකි කාර්යභාරය

උදා : - උප්පැන්න සහතික නැති දරුවන් හඳුනා ගැනීම හා තොරතුරු ලබා දීම, පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම හා මැදිහත්වීම, අනාරක්ෂිත දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීම

**<u>ii) දරුවන්ගේ ආරක්ෂාව</u>**

අනාරක්ෂිත දරුවන් /වගකීම් විරහිත දෙමාපියන් පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ නම් එම තොරතුරු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී / සහකාර වෙත ලබා දීම මඟින් අනාරක්ෂිත බව අවම කිරීමට අවශ්‍ය සහාය ලබා දීම

ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සඳහා විදුහල්පතිවරයෙකු ලෙස ලබා දිය හැකි දායකත්වය

**<u>iii) දරුවන්ගේ පැවැත්ම</u>**

ළමා අයිතිවාසිකම් කඩවීමට බලපාන ප්‍රධාන කරුණු හා එම තත්ත්ව මඟ හරවා ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන කටයුතු

**<u>iv) දරුවන්ගේ සහභාගීත්වය</u>**

කවර කටයුත්තකදී වුව ද දරුවාගේ මතය විමසීමේ වටිනාකම සහ ළමා සමාජ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා විදුහල්පතිවරුන්ට ලබා දිය හැකි දායකත්වය

උදා:- රොජර් හාර්ට්ගේ සහභාගීත්ව ඉනිමග වැනි ක්‍රමවේද ඇසුරු කර ගනිමින් දරුවන්ගේ සහභාගීත්වය අර්ථාන්විතව ලබා ගැනීම

***<u>2 . දෙවන දිනය -2025-09-26</u>***

වැඩසටහන්

1. පාසල් දරුවන් ප්‍රවාහනය කරන රථවාහන දීපව්‍යාප්තව පරීක්ෂා කිරීම හා ස්ටිකර් ඇලවීම

2. පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ප්‍රතිසංවිධානය කිරීම

**ක්‍රියාත්මක කරන ආයතන** - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව

අරමුණු:-

- දරුවන් සඳහා සුරක්ෂිත ප්‍රවාහන සේවාවක් ලබා දීම

- සියලුම පාසල්වල ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ක්‍රියාකාරීව පවත්වාගෙන යාම

**ක්‍රමවේදය :-**

නිසි ප්‍රමිතියෙන් යුතුව දරුවන් ප්‍රවාහනය කරනු ලබන වාහන හඳුනා ගැනීමට ස්ටිකරයක් ඇලවීම සඳහා මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය , ජාතික ගමනාගමන කොමිෂන් සභාව යන ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.

- පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවා නොමැති පාසල්වල කමිටු පිහිටුවීම හා අක්‍රීය කමිටු ප්‍රතිසංවිධානය කිරීම

කාල සීමාව:- 2025-09-26 සිට 2025.10.01 දින දක්වා සතිය තුළ

***<u>3 . තුන්වන දිනය -2025-09-27</u>***

වැඩසටහන- ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පෙර පාසල් ගුරු භූමිකාව පිළිබඳව පාලිකාවන් දැනුම්වත් කිරීම

**ක්‍රියාත්මක ආයතනය** - මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය

අරමුණු:-

- දරුවෙකු සමාජානුයෝජනයට ලක්වන ප්‍රධාන ස්ථානයක් වන්නේ මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන වන බැවින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා පෙර පාසල් පාලිකාවන්ගේ කාර්යයභාරය හඳුන්වා දීම

- ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පෙරපාසල් පාලිකාවගේ කාර්යභාරය හඳුන්වා දීම

- දරුවන් සම්බන්ධයෙන් පවතින නීති පිළිබඳ දැනුම්වත්භාවය ලබාදීම මගින් පෙර පාසලට යොමුවන දරුවන් මෙන්ම බාහිර සමාජයේ දරුවන්ට සිදු වන හිංසන අවම කිරීමට පෙරපාසල් පාලිකාවන්ගේ සහාය ලබා ගැනීම

- දරුවන්ට අවශ්‍ය අනෙකුත් සහායක සේවාවන් සම්පාදනය සඳහා පෙරපාසල් පාලිකාවන්ගේ දායකත්වය ලබා ගැනීම

- ළමා අයිතිවාසිකම් පිළිබඳව පෙරපාසල් පාලිකාවන්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම

- අවදානමට ලක්විය හැකි දරුවන් හඳුනා ගෙන ඊට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමට පෙර පාසල් පාලිකාවන්ගේ සහාය ලබා ගැනීම

ක්‍රමවේදය:-

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සියළුම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පාලිකාවන් දැනුම්වත් කිරීම

- මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකසා ගැනීම (කොට්ඨාසය තුළ පවතින පෙරපාසල් සහ ළමුන් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සහ නිලධාරීන්)
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ සහකාර හෝ සුදුසු සම්පත්දායකයෙකුගේ දායකත්වය ලබා ගෙන වැඩසටහන පැවැත්වීම

කාල සීමාව :- උපරිම කාලය පැය 02 යි

දැනුම්වත් කළ යුතු කරුණු :-

හඳින්වීම

- ළමයා යනු කවුද?
- ළමයින් සම්බන්ධයෙන් අදාළ වන නීති මොනවාද?
- ළමා අයිතිවාසිකම් මූලධර්ම (දරුවාගේ උපරිම යහපත, වෙනස්කොට නොසැලකීම, පැවැත්ම හා සංවර්ධනය, දරුවාගේ මතය)
- දරුවන් සම්බන්ධව සැළකිලිමත් විය යුතු කරුණු පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ පැහැදිලි කිරීම.

<u>i) දරුවන්ගේ සංවර්ධනය</u>

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දී හෝ බාහිර පරිසරයේ දී හමුවන දරුවන් සම්බන්ධයෙන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන්ට සිදු කළ හැකි කාර්යයභාරය

උදා : - උප්පැන්න සහතික නැති දරුවන් හඳුනා ගැනීම හා තොරතුරු ලබා දීම, පෙර පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම හා මැදිහත්වීම, අනාරක්ෂිත දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීම

<u>ii) දරුවන්ගේ ආරක්ෂාව</u>

අනාරක්ෂිත දරුවන් /වගකීම් විරහිත දෙමාපියන් පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ නම් එම තොරතුරු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සහකාර වෙත ලබා දීම මඟින් අනාරක්ෂිත බව අවම කිරීමට අවශ්‍ය සහාය ලබා දීම

ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවක් ලෙස ලබාදිය හැකි දායකත්වය ලබා දීම

**<u>iii) දරුවන්ගේ පැවැත්ම</u>**

ළමා අයිතිවාසිකම් කඩවීමට බලපාන ප්‍රධාන කරුණු හා එම තත්ත්වයන් මඟ හරවා ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන කටයුතු

**<u>iv) දරුවන්ගේ සහභාගීත්වය</u>**

කවර කටයුත්තකදී වුව ද දරුවාගේ මතය විමසීමේ වටිනාකම සහ ළමා සමාජ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන්ට ලබා දිය හැකි දායකත්වය

***<u>4. හතර වන දිනය -2025-09-28</u>***

වැඩසටහන- මත් උවදුරින් දරුවන් වැලැක්වීම පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම

ක්‍රියාත්මක ආයතන - ශ්‍රී ලංකා පොලිසිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)

අරමුණු:-

- දරුවන් මත්ද්‍රව්‍යවලට ගොදුරුවීමේ අවදානම අවම කිරීම
- මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ප්‍රතිවිපාක පිළිබඳව ප්‍රජාවගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම සහ ප්‍රජාව සවිබල ගැන්වීම
- මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ප්‍රජාවගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම
- දරුවන්ට මත් ද්‍රව්‍යවලින් තොර සමාජයක ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම
- මත්ද්‍රව්‍යවලට දරුවන් යොමු වීම වැළැක්වීම සඳහා දරුවන් බලගැන්වීමට ළමා සමාජ වැඩසටහන දායක කර ගැනීම

ක්‍රමවේදය:-

- දරුවන් මත් ද්‍රව්‍ය භාවිතයට ගොදුරුවීම අවම කිරීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව දුම්කොළ, මත් ද්‍රව්‍ය සහ මද්‍යසාරවලින් ආරක්ෂාවීමට දරුවාට ඇති අයිතිය පිළිබඳව දරුවන් තුළ බල ගැන්වීම සඳහා වන වැඩසටහනක් ළමා සමාජ දරුවන් සමඟ සිදු කිරීම
- මෙම වැඩසටහන පාදක කර ගනිමින් ළමා සමාජ වැඩසටහන සක්‍රීයව ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි දායකත්වයක් ලබාදුන් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/සහකාර හඳුනා ගනිමින් එම නිලධාරීන් ඇගයීමට ලක් කිරීම

කාල සීමාව :- උපරිම කාලය පැය 02 යි

දැනුම්වත් කළ යුතු කරුණු :-

හැඳින්වීම

- මත් ද්‍රව්‍ය භාවිතයේ හානිකර තත්ත්වයන් මොනවා ද?
- මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දරුවන් යොමුවීම වැළැක්වීමට ප්‍රජාවේ කාර්යභාරය
- මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම අවම කිරීමට ගත හැකි පියවර පිළිබඳව දැනුම්වත් කිරීම
- මත්ද්‍රව්‍ය නිවාරණයේ වැදගත්කම අවධාරණය කිරීම

<u>i) දරුවන්ගේ සංවර්ධනය</u>

පවුල සහ බාහිර පරිසරයේ දී හමුවන අනාරක්ෂිත දරුවන් සම්බන්ධයෙන් ප්‍රජාවට සිදු කළ හැකි කාර්යයභාරය

උදා : - පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු ලබාදීම, අනාරක්ෂිත දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීම

<u>ii) දරුවන්ගේ ආරක්ෂාව</u>

අනාරක්ෂිත දරුවන් /වගකීම් විරහිත දෙමාපියන් පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ නම් එම තොරතුරු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී / සහකාර වෙත ලබා දීම මඟින් අනාරක්ෂිත බව අවම කිරීමට අවශ්‍ය සහාය ලබා දීම

<u>iii) දරුවන්ගේ පැවැත්ම</u>

ළමා අයිතිවාසිකම් කඩවීමට බලපාන ප්‍රධාන කරුණු හා එම තත්ත්වයන් මඟ හරවා ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන කටයුතු

<u>iv) දරුවන්ගේ සහභාගීත්වය</u>

කවර කටයුත්තකදී වුව ද දරුවාගේ මතය විමසීමේ වටිනාකම සහ ළමා සමාජ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජාවට ලබා දිය හැකි දායකත්වය

<u>*5. පස්වන වන දිනය -2025-09-29*</u>

වැඩසටහන්

1. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ආගමික නායකයන්ගේ කාර්යභාරය පිළිබඳව දැනුම්වත් කිරීම

2. පවුල මූලික කරගත් රසවින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම

ක්‍රියාත්මක ආයතනය- බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

1.1 ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ආගමික නායකයන්ගේ කාර්යභාරය පිළිබඳව දැනුම්වත් කිරීම

අරමුණු:-

- ආගමික නායකයින් සමාජය තුළ පිළිගැනීමට ලක් වූ පිරිසක් බැවින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ආගමික නායකයන්ගේ කාර්යයභාරය හඳුන්වා දීම
- දරුවන් සම්බන්ධයෙන් පවතින නීති පිළිබඳ දැනුම්වත්භාවය ලබාදීම මගින් ආගමික ස්ථානවලට යොමු වන දරුවන් මෙන්ම බාහිර සමාජයේ දරුවන්ට සිදු වන හිංසන අවම කිරීමට ආගමික නායකයන්ගේ සහාය ලබා ගැනීම
- දරුවන්ට අවශ්‍ය අනෙකුත් සහයක සේවාවන් සම්පාදනය සඳහා ආගමික නායකයන්ගේ දායකත්වය ලබා ගැනීම
- ළමා අයිතිවාසිකම් පිළිබඳව ආගමික නායකයන්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම
- අවදානමට ලක්විය හැකි දරුවන් හඳුනා ගෙන ඊට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමට ආගමික නායකයන්ගේ සහය ලබා ගැනීම

ක්‍රමවේදය

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සියළුම ආගමික මධ්‍යස්ථාන ආවරණය වන පරිදි ආගමික නායකයන් පොදු ස්ථානයක දී දැනුම්වත් කිරීම
- මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකසා ගැනීම (කොට්ඨාසය තුළ පවතින ආගමික ස්ථාන සහ ළමුන් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සහ නිලධාරීන්)
- ආගමික මධ්‍යස්ථාන වෙත යොමු වන ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ළමුන් සම්බන්ධයෙන් වැඩසටහන් පැවැත්වීමට ක්‍රමවේද සකසා ගැනීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව ළමුන් සම්බන්ධ සුවිශේෂී ගැටළු හඳුනා ගැනීමට හා ඒවා අවම කිරීමට ආගමික නායකයින්ගේ දායකත්වය ලබා ගත හැකි ක්‍රමවේද සකසා ගැනීම
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ සහකාර හෝ සුදුසු සම්පත්දායකයෙකුගේ දායකත්වය ලබා ගෙන වැඩසටහන පැවැත්වීම

කාල සීමාව :- උපරිම කාලය පැය 02 කි

දැනුම්වත් කළ යුතු කරුණු :-

හැඳින්වීම

- ළමයා යනු කවුද?
- ළමයින් සම්බන්ධයෙන් අදාළ වන නීති මොනවාද?

- ළමා අයිතිවාසිකම් මූලධර්ම (දරුවාගේ උපරිම යහපත,වෙනස්කොට නොසැලකීම, පැවැත්ම හා සංවර්ධනය,දරුවාගේ මතය)
- දරුවන් සම්බන්ධව වඩා සැළකිලිමත් විය යුතු පහත සඳහන් කරුණු කෙරෙහි අවධාරණය කිරීම

**<u>i) දරුවන්ගේ සංවර්ධනය</u>**

පාසලේ දී හෝ බාහිර පරිසරයේ දී හමුවන දරුවන් සම්බන්ධයෙන් ආගමික සිදු කළ හැකි කාර්යභාරය

උදා : - උප්පැන්න සහතික නැති දරුවන් හඳුනා ගැනීම හා තොරතුරු ලබා දීම/ පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම හා මැදිහත්වීම/ අනාරක්ෂිත දරුවන් පිළිබඳ තොරතුරු ලබා දීම

**<u>ii) දරුවන්ගේ ආරක්ෂාව</u>**

අනාරක්ෂිත දරුවන් /වගකීම් විරහිත දෙමාපියන් පිළිබඳව තොරතුරු අනාවරණය වී තිබේ නම් එම තොරතුරු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී / සහකාර වෙත ලබා දීම හා එම තත්වය අවම කිරීමට අවශ්‍ය සහාය ලබා දීම

දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට ළමා සමාජ වැඩසටහන සඳහා ආගමික නායකයන් ලෙස ලබා දිය හැකි දායකත්වය

දරුවන් පිළිබඳව දෙමාපියන්ගේ වගකීම හා මාපිය දූදරු සම්බන්ධතා වල වැදගත්කම පිළිබඳව දායකයන් / බැතිමතුන් දැනුම්වත් කිරීම

උපකාර අවැසි දරුවන්ට උපකාර කිරීමට පොදු ප්‍රජාවගේ සිත් සංවේදී කිරීමට ආගමානුකූලව කරුණු පහදා දීම මෙන්ම දරුවන් වෙනුවෙන් වගකියන ප්‍රජාවක් තම ගම තුළ නිර්මාණය කිරීමේ නායකත්වය ආගමික නායකත්වයට සිදු කළ හැකි බව

**<u>iii) දරුවන්ගේ පැවැත්ම</u>**

ළමා අයිතිවාසිකම් කඩවීමට බලපාන ප්‍රධාන කරුණු හා එම තත්ත්වයන් මඟ හරවා ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන කටයුතු

**<u>iv) දරුවන්ගේ සහභාගීත්වය</u>**

ආගමික දිවියකට දරුවකු ඇතුළත් කර ගැනීමේ දී හෝ ආගමික ස්ථානවල පවත්වනු ලබන ළමා ක්‍රියාකාරකම් හෝ ආගමික වැඩසටහන්වල දී දරුවන්ගේ මතය විමසීමට ලක්කිරීමේ වැදගත්කම පහදා දීම

ළමා සමාජ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා ආගමික ස්ථානවලින් ලබා දිය හැකි දායකත්වය පැහැදිලි කිරීම

***<u>සැ.යු.</u> කිසිදු අවස්ථාවක කවර වුව ආගමකට ගැරහීමට/දොස් පැවරීමට හෝ මතවාදයට තුඩු දෙන කරුණු ඉදිරිපත් කිරීමෙන් වැලකිය යුතු අතර මූලික අවශ්‍යතාවය වන්නේ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පමණක් බව සිහි තබා ගත යුතුය.***

## 2.1 පවුල මූලික කරගත් රසවින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම

වැඩසටහන - පවුල මූලික කරගත් රසවින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම

ක්‍රියාත්මක ආයතනය- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

අරමුණු :-

- පවුල් සංකල්පය නිර්වචනය කිරීම හා එහි වැදගත්කම පිළිබඳව දරුවන් සහ ප්‍රජාව දැනුමවත් කිරීම
- අන්‍යෝන්‍ය සුහදත්වය සාමූහිකව කටයුතු කිරීම වැනි මානව ගුණධර්ම පුරුදු පුහුණු කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීම
- ළමා මිතුරු පවුල් පරිසරයක් නිර්මාණය කිරීම
- දරුවන් පවුල තුළින් වෙන්වීම වළක්වා පවුල තුළ සුරක්ෂිත කිරීම

ක්‍රමවේදය

- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ දායකත්වයෙන් සංස්කෘතික මධ්‍යස්ථාන 219 ක් ඉලක්ක කර ගනිමින් රසවින්දන වැඩසටහන්, වැඩිහිටි නිවාස, ළමා සංවර්ධන මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගත් වැඩසටහන්, චිත්‍ර-සංගීතමය වැඩසටහන් ක්‍රියාවට නැංවීම

කාල සීමාව :- උපරිම කාලය පැය 02 කි .

දැනුම්වත් කළ යුතු කරුණු :-

හැඳින්වීම

- පවුලේ විවිධ ස්වරූපයන් නිර්වචනය කිරීම පවුල් සංකල්පයේ වැදගත්කම
- පුද්ගලයකු තුළ මානව හිතවාදී ගුණධර්ම වර්ධන කර ගැනීමේ අවශ්‍යතාවය
- සාමූහිකත්වය සුහදත්වය වැනි යහපත් ගුණධර්ම මගින් පුද්ගල චර්යාවට ඇති කරන බලපෑම
- යහපත් පවුල් පරිසරයක් ඇති කර ගැනීමේ කාලීන අවශ්‍යතාවය

**සම්පත්දායකත්වය:-** ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටි බල ප්‍රදේශයන්හි පවතින රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි වැඩසටහනට සම්බන්ධ කරගත හැකි සම්පත්දායකයින්, විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් සහ විශ්‍රාමලත් රාජ්‍ය නිලධාරීන්

**සම්බන්ධීකරණය :-** සංස්කෘතික නිලධාරීන්/ සංස්කෘතික සහකාර හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හා කාන්තා ඒකකයේ නිලධාරීන්

***6. හයවන දිනය -2025-09-30***

වැඩසටහන - සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් (01-05 ශ්‍රේණිය)

**ක්‍රියාත්මක ආයතන-** සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**අරමුණු:-**

- ඩිජිටල් තිරවලට ඇබ්බැහිවීම වලක්වාලීම පිළිබඳව පාසල් දරුවන් දැනුම්වත් කිරීම
- පෝෂණය නිසි පරිදි පවත්වාගෙන යාමේ ඇති වැදගත්කම පිළිබඳව දරුවන් දැනුම්වත් කිරීම
- යහපත් චර්යාවන් ඇති කර ගැනීම සඳහා දරුවන් තුළ අභිප්‍රේරණයක් ඇති කිරීම
- සෞඛ්‍ය සම්පන්න ජීවිතයක වැදගත්කම පිළිබඳව දරුවන් දැනුම්වත් කිරීම
- පන්ති කාමරය තුළ සිටින දරුවන්ගේ සෞඛ්‍ය මට්ටම පිළිබඳව ගුරුවරුන් තුළ දැනුම්වත් වීමක් ඇති කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීම

**ක්‍රමවේදය:-**

- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද විනාඩි 30 ක වීඩියෝවක් පාසල්වල 1 – 5 වසරවල දරුවන්ට නැරඹීමට අවස්ථාව ලබාදීම
- වීඩියෝව ප්‍රදර්ශනය කිරීමට පහසුකම් නොමැති පාසල් සඳහා වීඩියෝවේ අන්තර්ගතය කතාන්දරයක් ලෙස දරුවන්ට ඉදිරිපත් කිරීම
- ශරීර ස්කන්ධ දර්ශකය දරුවාටම මැන බැලීමට /සටහන් කිරීමට ක්‍රමවේදයක් සැකසීම හා එය පංතිකාමරය තුළ ක්‍රියාකාරකමක් ලෙස සිදු කිරීම

**කාල සීමාව:-** විනාඩි 30

***7. හත්වන දිනය - 2025-10-01***

වැඩසටහන :- ලෝක ළමා දින ජාතික සැමරුම් උත්සවය

ස්ථානය - අරලියගහ මන්දිරය

**<u>08. සතිය පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්</u>**

වැඩසටහන්:-

01. අනාරක්ෂිත දරුවන් හඳුනා ගැනීම

02. වීදි දරුවන් පරීක්ෂා කිරීම

ක්‍රියාත්මක කරන ආයතන - ශ්‍රී ලංකා පොලිසිය

අරමුණු:-

- අනාරක්ෂිත දරුවන් හඳුනා ගැනීම
- වීදි දරුවන් පරීක්ෂා කිරීම

ක්‍රමවේදය:-

- දිවයින පුරා ඇති පොලිස් ස්ථානවල නිලධාරීන් විසින් අනාරක්ෂිත දරුවන් හඳුනා ගැනීම සහ වීදී දරුවන් පරීක්ෂා කිරීම

කාල සීමාව:- 2025.09.25 දින සිට 2025.10.01 දින දක්වා

ගයනි කෞශල්‍යා විජේසිංහ
කොමසාරිස්

පිටපත්

පොලිස්පති - ශ්‍රී ලංකා පොලිසිය

දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල

ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ - මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

අධ්‍යක්ෂ - සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

සභාපති - ජාතික ගමනාගමන කොමිෂන් සභාව

සභාපති - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

විධායක අධ්‍යක්ෂ - මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය